# අධ්‍යාපන කාරකයක් ලෙස නාට්‍ය භාවිතය

කේ. ඒ. ඒ. අයි. කෝදාගොඩ

It is a well known fact that there are three taxonomies of Educational activities or process of learning. Cognitive domain (Knowledge), Affective domain (attitudes or self) and kinesthetic domain (skills). As a practicable mechanism, art of drama has an effective capability to experience the above mentioned taxonomies practically. It assists in the process of learning with a variety of learning structures. Thus, the art of drama is capable of strengthening audio, visual and cognitive parts of learning. Drama allows student to follow experiential learning, moreover it helps a student to remember the above experience whenever he needs and this kind of learning can make a long lasting impact on the student.

© කේ. ඒ. ඒ. අයි. කෝදාගොඩ

සංස්. පී. ඒ. අමිල මදුසංක, ජයමල් ද සිල්වා, දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ, චන්දන රුවන් කුමාර, එච්. ඒ. ගිහාන් මධුසංඛ, නන්දුලා පෙරේරා
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, සිවු වැනි කලාපය - 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

මානව ඉතිහාසයේ අන් කවර කලකටත් වඩා අද්‍යතන ලෝකය විද්‍යාව සහ තාක්ෂණය මුල් කරගනිමින් අඛණ්ඩ ව වෙනස් වන ආර්ථික, දේශපාලනික, පාරිසරික හා සමාජ ප්‍රවාහය හමුවේ නො සැලී සිටීමට මිනිසා දරන වෑයම සුළුපටු නො වේ. ඇත්ත වශයෙන් ම මිනිසාට මේ ශක්තිය ලබාදෙන්නේ කෙබඳු ආයතනයක් මඟින් ද? අතීතයේ සිට ම මිනිසා තැනීමේ වගකීම භාර ව තිබුණේ අධ්‍යාපනයට යි. ක්‍රමයෙන් එය අධ්‍යාපන ආයතන බවට පත් වී අද වන විට විධිමත් අධ්‍යාපනයක් ලබාදෙන පාසල හා උසස් අධ්‍යාපන ආයතන දක්වා ඒ කාර්ය භාරය පුළුල් වී ඇත. ඉගැනීම නම් ක්‍රියාවලිය ඥානන, ආවේදනාත්මක සහ චලකේන්ද්‍රික යන ප්‍රධාන අංශ තුනක සිදු වන බවත්, මේ එක් එක් අංශය යටතේ විවිධ මට්ටම්වල කුසලතා වර්ධනය කළ හැකි බවත් අපි දනිමු. අධ්‍යාපනඥයන් කළ යුතු දුෂ්කර කාර්යය වන්නේ ඒ අංශ සියල්ල පුද්ගලයා (ශිෂ්‍යයා) වෙත ළඟා කරමින් ඒ එක් එක් අංශවල කුසලතා වඩාත් ගැඹුරින් සංවර්ධනය කිරීම යි. අධ්‍යාපනයේ මූලික බලාපොරොත්තුව පූර්ණ පෞරුෂයකින් යුතු පුද්ගලයකු බිහි කරගැනීම බවත්, හිස, හද, අත යන අංග තුන සංවර්ධනය ඔස්සේ පූර්ණ පෞරුෂයක් ගොඩනැඟීමට හැකි බවත් මහත්මා ගාන්ධි, නයිතාලීම් (අධ්‍යාපනික ශිල්ප) සංකල්පය ඔස්සේ ගෙන හැර දක්වයි.[1] බී. එස්. බ්ලූම් (B.S. Bloom) සිය අධ්‍යාපන අරමුණු වර්ගීකරණයෙන් ඉදිරි පත් කළේ පුද්ගලයකු ප්‍රජානන, ආවේදන හා මනෝචාලක ක්ෂේත්‍ර තුන ඔස්සේ දැනුම, ආකල්ප හා කුසලතා වශයෙන් සමබර වර්ධනයකට යොමු විය යුතු බව යි.[2] පුද්ගලයකු ලබන අධ්‍යාපනය සමතුලිත වීමට නම් මේ අවස්ථා තුන ම පරිපූර්ණ විය යුතු ය. පුද්ගල පෞරුෂය සමතුලිත වන්නේ එසේ සිදු වුව හොත් පමණක් බව බ්ලූම් අවධාරණය කරයි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාවෙහි ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පරීක්ෂා කර බැලූ විට පෙනී යන්නේ ශිෂ්‍යයාට ඉගැන්වීමට සහ ඔහු ඇගැයීමට භාවිත කර ඇති අධ්‍යාපන මනෝවිද්‍යාත්මක ක්‍රමවේද බොහෝමයක් දායකත්වය ලබාදෙන්නේ මතකයේ තබාගැනීම, දැනුම යළි සිහි කැඳැවීම, කරුණු අවබෝධ කරගැනීම හෝ අර්ථය ගොඩනඟාගැනීම වැනි ඥානන කුසලතා කිහිපයක් වර්ධනය කිරීමට පමණක් වන බව යි. යොදාගැනීම, විශ්ලේෂණය,

සංස්ලේෂණය හෝ තක්සේරුව වැනි වඩාත් ගැඹුරු ඥානන කුසලතා වර්ධනයට ඉන් සහාය ලැබෙන්නේ කලාතුරකින් වන අතර පුද්ගලයකුට සාකල්‍ය වූ අධ්‍යාපනයක් ලබාදීම සඳහා වර්ධනය කළ යුතු අනෙකුත් අත්‍යවශ්‍ය ඉගැනුම් ක්ෂේත්‍ර වන ආවේදනික සහ චලකේන්ද්‍රික අංශ එමඟින් පූර්ණ වශයෙන් නො සලකා හැර තිබේ. ඒ නිසා අපගේ ඉගැනුම් ක්‍රමවේදය පිළිබඳ යළි සලකා බැලීම සඳහා දැඩි අවශ්‍යතාවක් පවතී. අධ්‍යාපන අමාත්‍යංශය "අනාගත පුරවැසියා"[3] යනුවෙන් නම් කර ඇති අපේක්ෂා ලැයිස්තුවේ අවධාරණය කර ඇති ආකාරයට බහු සංස්කෘතික පරිසරයක ජීවත් වීමට ඇති හැකියාව, විවිධත්වයට ගරු කිරීම, ගැටුම් ඇති නො කරගෙන කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීම, අන් අයගේ අදහස් අවබෝධ කරගැනීම යනාදි චරිත ලක්ෂණ ගණනාවක් අතුළත් කර තිබුණ ද වර්තමාන අධ්‍යාපන ක්‍රමයෙහි ගෝලීය ආකල්ප වැඩි වශයෙන් භාවිත වන්නේ විලාසිතාවකට භාවිත වන පද වශයෙන් මිස "අනාගත පුරවැසියා" යථාර්ථයක් බවට පත් කරගැනීම සඳහා ප්‍රත්‍යක්ෂ ක්‍රියා මාර්ග ගැනීමට නො වේ. මේ හේතුව නිසා පංති කාමරයේ මේ යහපත් සංකල්ප පුරුදු පුහුණු කිරීමේ හැකියාව ඇති කිරීමට ප්‍රත්‍යක්ෂ ක්‍රමවේද සලසන්නා වූ ඉගැනුම් ශිල්පක්‍රම සහ පරිචයන් අපගේ අධ්‍යාපන ක්‍රමයට ඒකාබද්ධ කිරීම සඳහා දැඩි අවශ්‍යතාවක් පැන නැඟී තිබේ.

## අධ්‍යාපනය සඳහා නාට්‍ය භාවිතය සුදුසු වන්නේ ඇයි?

ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා කලා මාධ්‍ය යොදාගැනීම, යට දැක්වූ සංකල්ප ප්‍රායෝගික ව භාවිතයට ගැනීම සඳහා සහාය ලබාදීමේ එක් යාන්ත්‍රණයකි. විශේෂයෙන් ම නාට්‍ය කලාව විවිධාකාර ඉගැන්වීමේ ආකෘති සඳහා පහසුකම් සැලැසිය හැකි අන්දමේ විවිධත්වයක් සහිත කලා මාධ්‍යයක් වන අතර ශ්‍රව්‍ය, දෘශ්‍ය, චල කේන්ද්‍රික හෝ ඉහත සඳහන් කළ අංශ සියල්ල ම හෝ කෙරෙහි නාට්‍ය කලාව මඟින් පහසුකම් සැලැසෙයි. නාට්‍ය භාවිතයෙන් පංතිකාමරයෙහි ආවර්ජනීය, අභිනිර්මාණවාදී සහ සක්‍රීය (reflective, constructivist and active) ඉගැනුමක නිරත වන්නට ඉඩකඩ සලසන අතර මේ හැකියාව ප්‍රබල සහ අඟනා ඉගැනුම් ක්‍රමෝපායයක් ලෙස සලකනු ලැබේ. මෙහි දී හුදෙක් දැනුමෙන් පෝෂිත පුද්ගලයකු පමණක් නොව, ප්‍රායෝගික අභියෝග ජයගත

හැකි කාලීන අවශ්‍යතාවනට ගැළපෙන පුද්ගලයකු බිහි කිරීම අපේක්ෂා කරයි. නාට්‍ය නැමැති විෂයෙහි ප්‍රබල ශක්‍යතා ගණනාවක් හඳුනාගත හැකි ය. එහි දී න්‍යායාත්මක දැනුම පමණක් නො ව ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි ඇතුළත් එසැණ නිරූපණ, අවස්ථා නිරූපණ, අනුකරණ, අනුරූපණ, භූමිකා නිරූපණ වැනි ක්‍රියාකාරකම් මඟින් වාචික සංවර්ධනය, ශාරීරික හා බුද්ධිමය, පරිකල්පනය හා භාවමය සංවර්ධනය මැනැවින් සිදු වේ. ආත්ම විශ්වාසය, පරිකල්පන හැකියාව, සහකම්පනය, සාමූහික බව, සිත එකඟ කරගැනීම, සන්නිවේදන කුසලතා, ගැටලු විසඳීම, විනෝදය, භාවමය ප්‍රකාශනය, සැහැල්ලු බව, ස්වයං විනය, දැඩි විශ්වාසය, ශාරීරික යෝග්‍යතාව, සමාජය පිළිබඳ දැනුම්වත් බව ආදි විවිධ අංශ සංවර්ධනය නාට්‍ය විෂයයෙහි ඇති ප්‍රබල ශක්‍යතා ය. නාට්‍යය යන වචනය අපට කිසි දිනක ජීවිතයෙන් ඉවත් කළ නො හැකි යැ යි සඳහන් කරන **ජෙරොම් බෲනර්** පුද්ගල සංවර්ධන ක්‍රියා මාර්ගයේ දී නාට්‍ය අතිශයින් ම වැදැගත්කමකින් යුත් ක්‍රියාමාර්ගයක් බව දක්වයි. නාට්‍ය මිනිස් වර්ගයාගේ හැඩ ගැන්වීමෙහි හා ඉගැනුම් ක්‍රියාවලියේ දී ප්‍රධානත ම කාරකයකි. ළමයකු ලබා ඇති ආනන්දජනක අද්දැකීම් හා ජීවිතයට ඉතා සම්බන්ධ අපූර්වත්වයක් ප්‍රීති සහගත ව විඳහා පෑමට ඇති අවස්ථාවක් හැටියට ද දැක්විය හැකි ය.[4]

නාට්‍ය විෂයයෙහි ඇති එක් විශිෂ්ට ගුණාංගයක් වන්නේ එය විවිධාකාරයේ ඉගැනුම් විලාසයනට එක සේ උචිත වීම යි. නාට්‍යය නැමැති ඉගැනුම් ක්‍රමවේදය ඇතුළත් කරමින් මනා ව සැලැසුම් කරන ලද පාඩමක් මඟින් ඉගැනුම් ක්‍රියාවලියේ වඩාත් ගැඹුරු මට්ටම් කරා ළඟා වීමට මනා දායකත්වයක් ලබාදේ. විශේෂයෙන් ම ආවේදනාත්මක සහ චලකේන්ද්‍රීය අංශ සඳහා ඉන් ලැබෙන්නේ ඉමහත් දායකත්වයකි. තව ද අද්දැකීම් හරහා උකහාගන්නා ඉගැනුම (experiential learning) යාවජීව අධ්‍යාපනයකට මඟ පාදයි. ඉගැන්වීමේ දී භාවිත කරන සියලු ආකාරයේ ශ්‍රව්‍ය දෘශ්‍ය අද්දැකීම් වර්ග කොට දක්වන **එඩ්ගාර් ඩේල්** සිය අත්දැකීම් කේතුවෙහි ස්ථාන එකොළස අතරින් නාට්‍යානුසාරී අද්දැකීම් සඳහා තුන් වැනි ස්ථානය ලබාදීමෙන් ඉගැන්වීමේ මාධ්‍යයක් ලෙස නාට්‍ය විෂයයෙහි ඇති වැදැගත්කම ගම්‍ය කරයි.[5]

ප්‍රබල නාට්‍යානුසාරී අද්දැකීම් අතරට භූමිකා රංගන, එසැණ නිරූපණ, නාද රූප, චලන රූප, නිශ්චල රූප, චරිත විස්තර, කතාන්දර කීම, රංග අභ්‍යාස අනුගමනය කළ හැකි අතර මෙහි දී ප්‍රජානන, ආවේදන සහ මනෝචාලක ක්ෂේත්‍ර තුන ම ආවරණය කරගැනීමට ඍජු ව ම දායක වෙයි. නාට්‍යානුසාරී අද්දැකීම් මගින් සිසුවා යමක් අත්විඳ එය අවබෝධ කරගැනීම පමණක් නො ව, තමන් ලද ඒ අද්දැකීම ආවර්ජනයට ද අවස්ථාව සලසා දෙයි. මෙවන් ස්වරූපයක ඉගැනුමක් වඩාත් ගැඹුරින් මනසට කා වැදෙනවා පමණක් නො ව එයින් සිසුවාට ඇති වන බලපෑම ද දීර්ඝ කාලීන වෙයි.

සුප්‍රකට ඇමරිකානු මනෝවිද්‍යාඥයකු වන **හොවාර්ඩ් ගාඩ්නර්** (1984) මනුෂ්‍ය බුද්ධිය හෙවත් මානසික හැකියා පිළිබඳ අපූරු න්‍යායයක් ඉදිරි පත් කළේ ය. එතෙක් සලකනු ලැබූවේ මානව බුද්ධිය හෙවත් මානසික හැකියා තක්සේරු කළ හැක්කේ භාෂා ඥානය, ගණිත ඥානය, තර්කානුකූල බව, සංඛ්‍යා, ශ්‍රේණි, රූප රටා වැනි තෝරාගත් නිශ්චිත හැකියාවලින් පමණක් බව යි. මේ තාක් බුද්ධිය මනින බුද්ධි පරීක්ෂණ සකස් කරන ලද්දේ ද එකී සංකල්ප අනුව ය. මේ ඒකාකාරී සසීත බුද්ධි පරීක්ෂණ ක්‍රමය බැහැර කොට ප්‍රතික්ෂේප කළ ගාඩ්නර් නව මතයක් වශයෙන් ස්වකීය "බහුවිධ බුද්ධිය පිළිබඳ න්‍යායය"[6] ඉදිරි පත් කළේ ය. ඒ අනුව බහුවිධ බුද්ධි න්‍යායයට අයත් බුද්ධියේ නිපුණතා අටක් **හොවාර්ඩ් ගාඩ්නර්** පෙන්වාදෙයි.

## බහුවිධ බුද්ධි (Multiple Intelligences)

| | |
|---|---|
| 1. වාචසික භාෂාමය බුද්ධිය | (verbal Linguistic Intelligence) |
| 2. තාර්කික ගණිතමය බුද්ධිය | (Logical - Mathematical Intelligence) |
| 3. පුද්ගල ඇතුළාන්ත බුද්ධිය | (Intra - Personal Intelligence) |
| 4. ස්වභාවධර්ම බුද්ධිය | (Naturalist Intelligence) |
| 5. අන්තර් පුද්ගල බුද්ධිය | (Inter - Personal Intelligence) |
| 6. කායික සංචලනමය බුද්ධිය | (Bodily - Kinesthetic Intelligence) |
| 7. දෘශ්‍ය අවකාශමය බුද්ධිය | (Visual - Spatial Intelligence) |
| 8. සංගීත රිද්මයානුකූල බුද්ධිය | (Musical - Rhythmic Intelligence) |

නාට්‍ය විෂයය ඔස්සේ ශිෂ්‍යයාට මේ නිපුණතා අට මඟින් ස්වකීය කුසලතා සංවර්ධනය කරගත හැකි වීම මනා ශක්‍යතාවකි. නිදසුන් ලෙස නාට්‍යකරණයේ දී සංවාද භාවිතය මඟින් වාචසික භාෂා කුසලතා වර්ධනය කරගත හැකි ය. දෙ වැනි ව තමාගේ තාල ඥානය හෝ සංගීතමය රුචිය හෝ හැකියා හෝ වර්ධනය කරගත හැකි ය. තුන් වැනි ව තර්කානුකූල බව, හේතුඵල සම්බන්ධතාව, කාලය පිළිබඳ හැඟීම ආදිය ඔස්සේ ගණිතමය කුසලතා ද වර්ධනය කරගත හැකි ය. සිවු වැනි ව අවකාශ භාවිතය, එනම් වේදිකාවේ උස, දිග, පළල, ගැඹුර ආදිය අවකාශයෙහි මනා ලෙස හැසිරවීමෙන් ඒ කුසලතා වර්ධනය කරගත හැකි ය. පස් වැනි ව වේදිකාවේ රංගනය, නර්තනය හෝ වෙනත් ශාරීරික ක්‍රියාකාරකම් මඟින් ස්වකීය සිරුර මනා ලෙස චලනය කිරීමෙන් එහි ශාරීරික කුසලතා සංවර්ධනය කරගත හැකි ය.ස වැනි ව වේදිකා නාට්‍යවල තේමාව, ගැඹුර, අර්ථකථනය, ජීවිතය, මනුෂ්‍යත්වය පිළිබඳ ලබන අවබෝධය, වේදිකාවේ ශික්ෂණය, විනය, අන්‍යෝන්‍ය සදාචාරය, එමෙන් ම වේදිකාවේ කෙරෙන ආත්මභාෂණ ආදිය මඟින් තමා පිළිබඳ ව අවබෝධයකින් යුතු ආත්මගත වර්ධනයක් ඇති කරගත හැකි ය. සත් වැනි ව නාට්‍යකරණය ඔස්සේ නිරන්තරයෙන් ම වැඩෙන සාමූහිකත්වය, අන්‍යෝන්‍ය සහසම්බන්ධතාව, නායකත්වය, වගකීම් දැරීම, දුර්වලතා හඳුනාගැනීම, අනෙකා ආරක්ෂා කිරීම වැනි මානව සබඳතා ඔස්සේ සමාජීය වශයෙන් පුද්ගලයාහට අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කරගත හැකි ය. අට වැනි ව ස්වභාව ධර්මයේ පැවැත්ම, එහි අන්‍යෝන්‍ය බැඳීම හා විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ පුද්ගල චරිත සංවර්ධනය කරගත හැකි ය. නාට්‍ය පිටපත්වල අන්තර්ගතයෙන් මෙන් ම රංගනයේ දී පුද්ගල හැසිරීම් යථාර්ථවාදී ලෙස හෝ ස්වාභාවික රිද්ම ඔස්සේ පවත්වා ගෙන යෑමට මේ කුසලතා පුද්ගලයාට උපකාරී වනු ඇත. මේ බහුවිධ බුද්ධියේ නිපුණතා විමර්ශනය කිරීමේ දී පෙනී යන්නේ නාට්‍ය හා රංගකලා විෂය, රංගන කුසලතා වර්ධනයට පමණක් නො ව සමස්ත බුද්ධි වර්ධනයට හා පෞරුෂ වර්ධනයට හේතු වන බව යි. **බී. එස්. බ්ලූම්**ගේ අධ්‍යාපන අරමුණු වර්ගීකරණය අනුව පුද්ගලයකුගේ ප්‍රජානන, ආවේදනික හා මනෝචාලක යන ක්ෂේත්‍ර තුනෙහි ම වර්ධනය සඳහා නාට්‍යකරණය යොදාගත හැකි ය. අප රටේ පාසල් විෂය මාලාවේ අන්තර්ගත

නාට්‍ය විෂය හැර අනෙකුත් විෂයයන්හි මේ ක්ෂේත්‍ර තුන අඩු-වැඩි වශයෙන් බෙදී යන අතර ඥානන, ආවේදනික සහ මනෝචාලක යන ක්ෂේත්‍ර තුනෙහි ම සමාන වර්ධනයක් වන්නේ නාට්‍ය හා රංගකලාව විෂයෙහි පමණි. ඉගැන්වීමේ මාධ්‍යයක් වශයෙන් නාට්‍යානුසාරී ක්‍රමය භාවිත කිරීමේ දී නාට්‍යය හා ප්‍රජානන සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව විමසා බැලිය යුතු ය. ළමයාගේ මනසට සහනයක් ගෙනදීමේ ගුණයක් නාට්‍ය නැමැති මාධ්‍යයෙහි පවතින නිසා ප්‍රජානන සංවර්ධනය උදෙසා නාට්‍ය ක්‍රමය ඉතා වැදැගත් බව සම්භාව්‍ය මනෝවිශ්ලේෂණවාදීහු පිළිගනිති. යථාර්ථවාදී ව යමක් තේරුම්ගැනීමට අපහසු ළමුනට පමණක් නො ව, වැඩිහිටියනට ද නාට්‍යානුසාරී ක්‍රියාදාමයන් මඟින් බුද්ධිමය ප්‍රතිභාවකට ඉඩකඩ සපයයි.

යථෝක්ත සියලු කරුණු ගොනු කර බලන විට ආධ්‍යාපනික නාට්‍යකරණයේ හරය නම් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක ශිෂ්‍යයා හුදෙක් නිසල ව අසා සිටීමෙන් පමණක් නො ව, යම් ක්‍රියාකාරී අවස්ථා උත්පාදනය කිරීමෙන් ඍජු හෝ වක්‍රාකාර අද්දැකීම් සජීවීකරණයෙන් යුතු ව ලබාදීම යි. එසේ ම ශිෂ්‍යයා වෙත යමක් බලහත්කාරයෙන් පටවනවා වෙනුවට ස්වයං පෙලැඹවීමෙන් හා රුචිකත්වයෙන් නිදහස් ඉගැනීම් අවස්ථා සම්පාදනය කිරීම ද ආධ්‍යාපනික නාට්‍යකරණයේ පරමාර්ථය යි.

## ආන්තික සටහන්

1. දසනායක, සෝමප්‍රිය (2007), **අධ්‍යාපනය** 41, පි. 5.
2. අබේපාල, රෝලන්ඩ් (2012), **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම**, පි. 167, 168.
3. සමාජ ඒකාග්‍රතාව සහ සාම අධ්‍යාපනය ජාතික ප්‍රතිපත්තිය (2008), අධ්‍යාපන අමාත්‍යාංශය.
4. අබේපාල, රෝලන්ඩ් (2008) **නාට්‍යකරණයේ මනෝවිද්‍යාමක නැඹුරුව**, අභිනය, පළමුවන කලාපය, පි. 102.
5. අබේපාල, රෝලන්ඩ් (2012) **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම**, පි. 242.
6. එම, පි. 260.

## මූලාශ්‍රය නාමාවලිය

අතුකෝරල, ඩී. ආර්. (2006), **අධ්‍යාපන මනෝවිද්‍යාව** හා අධ්‍යාපන ව්‍යවහාර පිළිබඳ රචනා, බොරැල්ල: ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අතුකෝරාල, ඩී. ආර් සහ අතුකෝරාල, එච්. එන්. (2009), **අධ්‍යාපන මනෝවිද්‍යාව** හාගුරුවරයා, බොරැල්ල: ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අබේපාල, රෝලන්ඩ්. (2004) **සෞන්දර්ය අධ්‍යාපන විවරණ**, කොට්ටාවා: සාර ප්‍රකාශන.

අබේපාල, රෝලන්ඩ්. (2008) **නාට්‍යකරණයේ මනෝවිද්‍යාත්මක නැඹුරුව.** (*අභිනය*). පළමුවැනි කලාපය.

අබේපාල, රෝලන්ඩ්. (2012) **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම.** කොට්ටාවා: සාරප්‍රකාශන.

**අභිනය - දයානන්ද ගුණවර්ධන උපහාර අංකය.** (2008) කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

කස්තුරි ආරච්චි, චන්දන. (2014) **අධ්‍යාපන කළමණාකරණය.** ගොතටුව නව නගරය: පී ඇන්ඩ් පී ඇසොසියේට්ස්.

ගලගමගේ, එස්. (2008) **අධ්‍යාපන සමාජ විද්‍යාව.** දෙහිවල: ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්.

ධර්මකීර්ති, ආර්. (1996) **නාට්‍ය ප්‍රවිශය: විමර්ශනාත්මක අධ්‍යයනයක්**, කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වන්නිගම, චන්ද්‍රදාස. (සංස්.) 2004) **අධ්‍යාපන විමර්ශන 2.** දෙහිවල: ශ්‍රී දේවි ප්‍රින්ටර්ස්.